*සැ. යු.*- 2018.11.02 දින පළ වූ අංක 2,096 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,097 - 2018 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2018.11.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1886 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1536 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 නොවැම්බර් මස 30 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 නොවැම්බර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1885 - B 81466— 5,403 (2018/11)
F 1 -

# පළාත් සභා නිවේදන

## වයඹ පළාතේ පළාත් සභාව

### 1946 අංක 57 දරන පොදු සුසාන සහ පෞද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ (I) යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තියේ II වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන හා පෞද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 (1) වගන්තිය අනුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක වන මා විසින් වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් සුසානය මළමිණි වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසානයක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ
ධර්මසිරි දසනායක,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා
පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, අධ්‍යාපන,
පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ
සංචාරක කටයුතු අමාත්‍ය.
වයඹ පළාත.

2018 ඔක්තෝබර් මස 05 වැනි දින.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත් පත්තුවේ, ඉහළ විසිදෙකේ කෝරළයේ පහළ වල්පොල පිහිටි, වී ලාස් එකොළහක් වපසරියක් ඇති කෙමන්පොල කුඹුර සහ ඊට යා වූ කුරහන් ලාස් තුනක වපසරිය ඇති, ඕ. ජී. නිමල්සිරි බලයලත් මානක නිලධාරි තැන විසින් මැන සකසා සහතික කළ අංක 5778 සහ 2017.12.31 වැනි දින දරන පැලැනේ ප්‍රකාර, කැබලි අංක 01 දරන (අක්. 0, රූ. 0, පර්. 19) *හෙවත්* හෙක්ටයාර් 0.0480ක් විශාල ''අඹකොටුවේ පිල්ලෑවත්' කියන, උතුරට : අප්පුනයිදේට සහ තවත් අයට අයිති කුඹුරේ නියර ද, නැගෙනහිරට : ගොඩකුඹුරේ ඉන්නියර ද, දකුණට : සෙල්ලප්පුට සහ තවත් අයට අයිති කෙමන් පොල කුඹුරේ ඉන්නියර ද, බස්නාහිරට : කැන්දවල නයිදෙලාගේ මැණික් එතනාට සහ තවත් අයට අයිති අඹකොටුව කුඹුරේ ඉන්නියර ද, මායිම් වූ ගොඩ මඩ ඉඩමෙන්, නොබෙදූ වී ලාස් තුන (3) ක් වපසරිය ඇති පිල්ලෑව නැමැති ඉඩම.

11-308

---

## බස්නාහිර පළාතේ පළාත් සභාව

### 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ, වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ (22) වගන්තිය යටතේ වන නිවේදනය

2011 අංක 05 දරන බස්නාහිර පළාතේ, වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ, වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ (22) වගන්තිය ප්‍රකාරව පහත විස්තර සඳහන් ව්‍යාපාර නාමයෙහි ලියාපදිංචිය, බස්නාහිර පළාතේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් වන සෙනරත් ආරච්චිගේ ලක්සිතා රංගනී වන මා විසින් අවසන් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ව්‍යාපාර නාමය : මහජන පොත්හල
ව්‍යාපාර ලිපිනය : අංක 141, නුවර පාර, කඩවත
ලියාපදිංචි කරන ලද දිනය : 2016.08.08
ලියාපදිංචි අංකය : WP 15274

එස්. ඒ. එල්. රංගනී,
බස්නාහිර පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්.

2018 ඔක්තෝබර් මස 10 වැනි දින,
රාජගිරිය, නාවල පාරේ,
අංක 512 හි පිහිටි,
පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ
දෙපාර්තමේන්තුවේ දී ය.

11-400

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.